# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 808 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திக / Date: 13/05/2024 පැය 2050

**මාධ්‍ය නිවේදනය**

**මුදල් ඔට්ටු මත අන්ත්‍රාදායක ලෙස යතුරුපැදි ධාවනය කරන ලද යතුරුපැදිකරුවන් 15 දෙනෙකු ගරු අධිකරණයට ඉදිරිපත් කිරීම - බම්බලපිටිය පොලිස් ස්ථානය.**

2024.05.05 වන දින අළුයම් කාලයේ බම්බලපිටිය පොලිස් වසමේ කොළඹ ගාල්ල ප්‍රධාන මාර්ගයේ මුදල් ඔට්ටු මත අන්ත්‍රාදායක ලෙස යතුරුපැදි ධාවනය කිරීම සම්බන්ධයෙන් යතුරුපැදිකරුවන් 15 දෙනෙකු යතුරුපැදි සමගින් බම්බලපිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට ඉදිරිපත් කිරීමෙන් පසු පොලිස් ඇප මත මුදාහැර තිබිණි.

**අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් වයස අවුරුදු 20 ත් 28 ත් අතර වයස්වල පසුවන කොළඹ හා අවට ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

පොලිස් භාරයට ගන්නා ලද යතුරුපැදි මෝටර් රථ වාහන පරීක්ෂකවරයා විසින් පරීක්ෂා කර ඒවායේ ඇති විවිධ අඩුපාඩු සම්බන්ධයෙන් වාර්තා කර ඇති අතර සැකකරුවන් 2024.05.13 වන අද දින කොළඹ අළුත්කඩේ ගරු රථවාහන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු සැකකරුවන් වෙත රුපියල් 427500.00 දඩ මුදලක් ගෙවීම සඳහා නියම කර රියදුරු බලපත්‍ර මාස 06 ක කාලයක් සඳහා අත්හිටුවා ඇත.

මෙයට පෙර ද අවස්ථා කිහිපයකදී ද යතුරු පැදිකරුවන් මෙලෙස අන්තරාදායක ලෙස යතුරුපැදි පැදවීම සම්බන්ධයෙන් එම පැදිකරුවන් අත්අඩංගුවට ගෙන ගරු අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු ගරු අධිකරණය මඟින් දඩ මුදල් ගෙවීමට නියෝග කර ඇත.

බම්බලපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**